අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறியீடு / My Ref.

ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.

දිනය / திகதி / Date

**<u>පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්</u>**

**<u>රාජනීතිඥ අතිගරු පැට්‍රීෂියා ස්කොට්ලන්ඩ් මහත්මිය ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය</u>**

**<u>රනිල් වික්‍රමසිංහ මහතා වෙත එවූ සුභාශිංසන පණිවුඩයේ සිංහල පරිවර්තනය.</u>**

2018.12.21

අග්‍රාමාත්‍යතුමනි,

ශ්‍රී ලංකාවේ උද්ගත වූ දේශපාලනික අර්බුදය සාමකාමී විසඳුමකට පත්වීම ගැන සතුටට පත් වන අතර, අග්‍රාමාත්‍යධූරයට යළිත් පත්වීම සනිටුහන් කරමින් දිවුරුම් දීම සම්බන්ධයෙන් ඔබට සුබ පතමි.

විශේෂයෙන්ම, නීතිය හා ව්‍යවස්ථාදායක කාර්යරාමුව පෝෂණය කර ආරක්ෂා කර ගැනීමට ඔබ විසින් හා අනෙකුත් අදාල පාර්ශවයන් විසින් දක්වන ලද අචල හා දැඩි ස්ථාවරය ගැන මාගේ ප්‍රශංසාව පළකරමි. ශ්‍රී ලාංකේය ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන්හි ශක්තිය හා ප්‍රත්‍යස්ථභාවය සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ග කෙරෙහි දේශපාලන කොටස්කරුවන්ගේ කැපවීම මෙකී අර්බුදය විසඳාගත් ආකාරයෙන් මනාව පැහැදිලි වේ.

අතිගරු මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමන්ට ද දන්වන ලද පරිදි, දේශපාලන සංහිඳියාව වැඩි දියුණු කරලීම, ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණයන්හි ප්‍රගමනය සහ නීතියේ ආධිපත්‍යයේ ආරක්ෂාව උදෙසා ශ්‍රී ලංකාව විසින් දරනු ලබන පරිශ්‍රමයන්ට සහාය වීමට පොදු රාජ්‍ය මණ්ඩලය නිරන්තරයෙන් සැදී පැහැදී සිටී.

ඉහත කී සන්දර්භයෙහි ලා, ශ්‍රී ලංකාව හා එක්ව ක්‍රියාත්මක කරලීමට අප විසින් අපේක්ෂා කරන ලද ව්‍යායාමයන් ගණනාවක්ම ප්‍රගතිය කරා මෙහෙයවීමට හැකි වේයැයි විශ්වාස කරන අතර, ඔබගේ රට සහ පොදු රාජ්‍ය මණ්ඩලය අතර පවතින දීර්ඝකාලීන සහ ඵලදායී සම්බන්ධතාවය තවදුරටත් පවත්වා ගෙන යාමේ දැඩි අපේක්ෂාවෙන්ද පසුවෙමු.

ගරු අග්‍රාමාත්‍යතුමනි, මාගේ අඛණ්ඩවූ හා නොසැලෙන්නාවූ හෘදයාංගම හිතෛෂිභාවය පිළිගනු මැනවි.

අත්.කළේ රාජනීතිඥ අතිගරු පැට්‍රිෂියා ස්කොට්ලන්ඩ්.

(ඉංග්‍රීසි පණිවුඩය මීට යා කොට ඇත.)

කාර්යාලය / அலுவலகம் / Gen. Office: 2575317, 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2574143, 2575454, 2575310
විද්‍යුත් තැපෑල / ஈ மெயில் / E-mail: secpm@pmoffice.gov.lk

Commonwealth Secretary-General

21 December 2018

Prime Minister,

I write to welcome the peaceful resolution of the political crisis in Sri Lanka and to congratulate you on the occasion of your swearing in to mark your re-installation as Prime Minister.

In particular, I commend you and other political stakeholders for your steadfastness in defense and support of the rule of law and the constitutional framework. The way in which the crisis was resolved is a testament to the strength and resilience of Sri Lanka's democratic institutions and to the commitment of political stakeholders to the democratic process.

As communicated to His Excellency President Maithripala Sirisena, the Commonwealth remains ready to support Sri Lanka's efforts to improve political reconciliation, progress constitutional reform, and entrench the rule of law.

In the above context, I trust we will be able to progress a number of engagements which we are hoping to take forward with Sri Lanka, and very much look forward to building on the longstanding and fruitful partnership between your country and the Commonwealth Secretariat.

Please accept, Prime Minister, the continued assurances of my highest consideration.

Patricia Scotland

**The Rt Hon Patricia Scotland QC**

The Honourable Ranil Wickremesinghe
Prime Minister of the Democratic Socialist Republic of Sri Lanka
Temple Trees
Colombo 03
**SRI LANKA**

Commonwealth Secretariat \ Marlborough House, Pall Mall, London SW1Y 5HX, United Kingdom
T +44 (0)20 7747 6103 \ F +44 (0)20 7930 2299 \ E sg@commonwealth.int
thecommonwealth.org

2/4